මැතිවරණ කොමිසමේ සාමාජික රත්නජීවන් හූල් ප්‍රසිද්ධියේම නිරෝධායන නීති කැඩූ බවට අද දිනයේ (05/20) මව්බිම සහ දිවයින පුවත්පත් ඔස්සේ සඳහන් කර තිබුණු පුවත් වාර්තාවන් දෙකකි. මව්බිම සහ දිවයින පුවත්පත දෙකේම මුල් පිටු පුවත් ලෙසින් පළව තිබූ මෙම පුවත් වාර්තාවන් හි සඳහන් වූයේ, එංගලන්තයේ සිට මෙරටට පැමිණ දින 14 ක නිරෝධායන කාලය අවසන් කළ හූල්ගේ දියණිය, හූල් සමගින් මැතිවරණ කොමිෂන් කාර්යාලයට පැමිණි බවයි. දින 14 ක නිරෝධායනය අවසන් කළ අයවලුන් තවත් දින 14 ක කාලයක් සිය නිවසේ නිරෝධායනයට ලක් විය යුතුව තිබුණත්, හූල් සහ ඔහුගේ දියණිය එම නිරෝධායන නීතිය උල්ලංඝනය කොට තිබෙන බවද වැඩිදුරටත් සඳහන්ව තිබිණි.

මව්බිම පුවත සිය මූලාශ්‍ර ලෙසින් සඳහන් කරන්නේ 'ආරංචි මාර්ග' වේ. දිවයින පුවත සිය මූලාශ්‍ර ලෙසින් මැතිවරණ කොමිෂන් කාර්යාලයේ සේවකයින්ව සඳහන් කරයි. කෙසේ නමුත් කුතුහලාත්මක ලෙසින් මෙම මුල් පිටු පුවත් දෙකම ලියූ මාධ්‍යවේදියෙකුගේ නම් සඳහන් වී නැත.

මෙහිදී අපගේ නිරීක්ෂණයන් පහත පරිදි වේ.

1) පුවත ලියූ මාධ්‍යවේදීන්ගේ නම් සඳහන් නොවීම ඔස්සේ පුවතේ විශ්වසනීයත්වය ගැටළුකාරී වන අතර, පොදුවේ මෙම පුවතේ වගකීම ඒ ඒ පුවත්පතේ කර්තෘ මණ්ඩල වෙතට බැර කිරීමට සිදුවේ.

2) මෙම පුවතේ විශ්වසනීය හා පැහැදිලි මූලාශ්‍රයන් නොදැක්වේ.

3) බහුමූලාශ්‍ර පරිශීලනයට හෝ මව්බිම හා දිවයින උත්සුක වී නැත. එසේම අදාළ චෝදනා එල්ලවන පාර්ශවය වන රත්නජීවන් හූල් සහ ඔහුගේ දියණිය සම්බන්ධ කරගනිමින්, මෙම පුවත් වාර්තාවේ ඔවුන්ගේ පාර්ශවයේ කරුණු විමසා හෝ විමසන්නට උත්සාහයක් ගෙන නොමැත. එසේ නම් මෙම දිවයින සහ මව්බිම පුවත් දෙකම ඒකපාර්ශ්වික වාර්තාකරණයන් නොවන්නේද?

මේ සියලුම කරුණු එකකට එකක් සසඳා බලන විට, මෙම මව්බිම සහ දිවයින මුල් පිටු පුවත් ද්විත්වයේම විශ්වසනීයත්වය ගැටළුකාරී යැයි පාඨක ප්‍රජාවට හැඟෙන්නේ නැතිද? මේ වගකීම් සහගත ජනමාධ්‍යකරණයෙන් අපගමනය වීමක් නොවේද? ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

**#MediaEthics #lka #SinhalaPress #Divaina #Mawbima**